# වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

# උපකුලපති තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 11 වන වගන්තියට අනුව සහ 2023.04.10 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 03/2023 දරන කොමිෂන් සභා චක්‍රලේඛණයට අනුකූලව පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද පටිපාටි අනුව වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ උපකුලපති තනතුර සඳහා සුදුසුකම්ලත් පුද්ගලයින් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 11 වන වගන්තියේ විධිවිධාන යටතේ, පාලක මණ්ඩලය විසින් නම් කරන ලද තැනැත්තන් තිදෙනෙකුගෙන් සමන්විත වන මඩුල්ලකින්, ජනාධිපතිවරයා විසින් අමාත්‍යවරයා විමසා, විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා පත් කරනු ලැබේ.

එකී පුද්ගලයින් තිදෙනාගේ මඩුල්ල තෝරාගනු ලබන්නේ, ඉදිකිරීම් හෝ නිෂ්පාදන ක්ෂේත්‍රයේ හෝ වෙනත් ඕනෑම තාක්ෂණ හෝ සේවා ක්ෂේත්‍රයක අධ්‍යාපන සුදුසුකම්, දැනුම සහ පළපුරුද්ද ඇති අය අතුරින් වන අතර, ඔවුන් අතුරින් එක් අයෙකු උපකුලපතිවරයා ලෙස තෝරාගනු ලැබේ.

අඛණ්ඩව දෙවතාවකට වඩා වැඩි කාලයක් සඳහා උපකුලපතිධුරයට පුද්ගලයෙකු පත් නොකළ යුතුය. උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ පූර්ණකාලීන නිලධාරියෙකු සහ ප්‍රධාන අධ්‍යයන නිලධාරියා ද විය යුතුය. ඔහු විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ සහ අධ්‍යයන සභාවේ නිල බලයෙන් පත්වූ සාමාජිකයෙකු මෙන්ම ඒවායේ සභාපතිවරයාද වනු ඇත.

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ ප්‍රතිපාදන සාක්ෂාත් කරනු වස් පාලක මණ්ඩලය මගින් කලින් කලට නීත්‍යානුකූලව නිකුත් කරනු ලබන විධිවිධානයන් සහ අදාළ ලේඛණයන් වල අන්තර්ගතයන් නිසි පරිදි පිළිපැදීම මෙන්ම ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය බලය දැරීම උපකුලපතිවරයාගේ රාජකාරිය වන්නේය. මෙම පනතේ විධිවිධානවලට යටත්ව, පාලක මණ්ඩලයේ සහ අධ්‍යයන සභාවේ තීරණ බලාත්මක කිරීම සහ ඒවා බලාත්මක වන බවට සහතික කිරීම උපකුලපතිවරයාගේ වගකීම විය යුතුය.

උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ ගණන් දීමේ නිලධාරියා වන අතර විශ්වවිද්‍යාලය තුළ විනය පවත්වා ගැනීම සඳහා වගකිව යුතුය. උපකුලපතිවරයා තම ධුරය කලින් අත්හලහොත් මිස, හෝ මෙම වගන්තිතේ (09) වන උප වගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, අවුරුදු හතරක (04) කාලයක් හෝ ඔහුගේ වයස අවුරුදු හැටපහ (65) සම්පූර්ණ කිරීම යන මෙයින් කලින් එළඹෙන අවස්ථාව දක්වා තම ධුරය දැරිය යුතු වන්නේ ය.

ජනාධිපතිවරයා විසින් නිසි හේතු දක්වා උපකුලපතිවරයාව ධුරයෙන් ඉවත් කළ හැකිය.

අයදුම්කරු ඉහළ මට්ටමේ අධ්‍යයන කුසළතාවයන්ගෙන් හෙබි සවිමත් පර්යේෂණ පැතිකඩක්, සනාථකළ නායකත්ව ගුණාංග සහ විවිධ කණ්ඩායම් සමඟ අරමුණු සහගතව ක්‍රියාකිරීමට අවශ්‍ය පුද්ගලාන්තර කුසලතාවලින් පූර්ණ වූ, පැහැදිළි අවබෝධයකින් ප්‍රතිපත්තිමය කාරණා පිළිබඳව කටයුතු කළ අයෙකු ලෙස සහ තීරණ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට කැපවීමක් ඇති අයෙක් ලෙස සනාථ කළහැකි අයෙකු විය යුතුය. ප්‍රජාව කෙරෙහි කැපවීම ඇතුළුව විශ්වවිද්‍යාලයේ ආචාරධර්ම සහ මෙහෙවර පිළිබඳ ගැඹුරු අවබෝධයක්ද අයදුම්කරු සතුව තිබිය යුතුය.

(වැඩිදුර විස්තර සඳහා විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය වන **www.uovt.ac.lk** වෙත පිවිසීමට අයදුම්කරුවන්ට ආරාධනා කෙරේ)

උපකුලපතිවරයා ඉහළම අධ්‍යයන වැටුප් පරිමාණයට සුදුසුකම් ලබන අතර තනතුරට අදාළ අනෙකුත් දීමනා සඳහාද හිමිකම් ලබයි.

උපකුලපතිවරයා පත්කිරීමේ තෝරාගැනීමේ ක්‍රියාවලිය වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා පත්කිරීමේ ක්‍රියාපටිපාටියේ දක්වා ඇති ආකාරයට සහ 2023 අප්‍රේල් 10 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 03/2023 දරන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුකූලව සිදු කරනු ලැබේ.

එම පත්වීමේ ක්‍රියාපටිපාටිය සඳහා **https://uovt.ac.lk/wp-content/uploads/2022/03/Procedure.pdf** වෙබ් ලිපිනය මගින් ප්‍රවේශ විය හැකිය. අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් වියයුතු අතර අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 61 ට අඩු විය යුතුය.

**අයදුම්පත් සමඟ පහත ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.**

i උපන් දිනයද ඇතුලත් වූ අයදුම්කරුගේ සම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාවක්.

ii වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ සංවර්ධනය සඳහා අයදුම්කරුගේ පෞද්ගලික දැක්ම සහ උපකුලපති තනතුරට පත් කළහොත් අයදුම්කරු අත්කර ගැනීමට යෝජනා කරන දේ පිළිබඳ කෙටි විස්තරයක් සහිත ලිඛිත ප්‍රකාශයක්.

iii වත්මන් උපකුලපතිවරයා අයදුම්කරුවෙකු වන්නේනම් හෝ අයදුම්කරු මීට පෙර වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ උපකුලපති තනතුර හෙබවූයේ නම්, ඉහත (i) සහ (ii) වගන්තිවල සඳහන් ලේඛනවලට අමතරව, අයදුම්කරුගේ පළමු ධුර කාලය තුළ අත්කරගත් ජයග්‍රහණ ඉස්මතු කරන වාර්තාවක් අයදුම්කරු විසින් ලබා දිය යුතුය.

iv අයදුම්කරු රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, රාජ්‍ය සතු ව්‍යවසායක සහ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය හැර වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක සේවය කරන අයදුම්කරුවෙකු නම්, අයදුම්කරු තනතුරට පත් වූ විට අයදුම්කරු එම සේවයෙන් නිදහස් කළ හැකිද යන්න සනාථ කිරීමට සේවා යෝජකයාගෙන් ලත් ලිපියක්.

උපකුලපති තනතුර සඳහා අයදුම්කරුවන් හට විශේෂ පාලක මණ්ඩල රැස්වීමකදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක් සහ ඇගයීමක් සඳහා ආරාධනා කරනු ලැබේ. යම් සුවිශේෂී තත්වයක් තුළ කිසියම් අපේක්ෂකයෙකුට විශේෂ පාලක මණ්ඩල රැස්වීමේ පෙනීසිටීමට නොහැකි වන්නේනම්, ලේකම්වරයාට සිදුකරන පූර්ව දැනුම්දීමකින් පසු අථත්‍ය මාදිලිය ඔස්සේ පෙනීසිටීමට අවසර ලබාදෙනු ලැබේ.

අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණය අතරතුර අවම වශයෙන් විනාඩි දහයක(10) සහ උපරිමව විනාඩි පහළොවක් (15) නොඉක්මවන කාලයකට අනුව කෙටි ඉදිරිපත් කිරීමක් කළ යුතුය.

---

ඉහත දක්වා ඇති පරිදි අදාළ ලියකියවිලි සහිත අයදුම්පත් අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය, අංක 100, කඳවල, රත්මලාන යන ලිපිනයට 2025 සැප්තැම්බර් 30 දින සවස 3.00 ට හෝ ඊට පෙර රහසිගතභාවය සුරැකි ලියාපදිංචි තැපෑලෙන් හෝ කුරියර් සේවාවක් මගින් එවිය යුතුය. නැතහොත් ඉහත කාර්යාලයට අතින් ගෙනැවිත් භාරදිය යුතුය. ඊට අමතරව, ඉහත සියලු ලේඛනවල සහ අදාල අනෙකුතුත් සහායක ලේඛන වල මෘදු පිටපත් PDF ආකෘතියෙන් **dg@uovt.ac.lk** විද්‍යුත් තැපැල් ලිපිනයට එවිය යුතුය.

අයදුම්පත් කාලය අවසන්වන දිනය සහ වේලාවෙන් පසු අයදුම්පත් භාර නොගනු ඇත. අයදුම්පත සහ අනෙකුත් ලියකියවිලි අඩංගු ලියුම්කවරයේ ඉහළ වම් කෙළවරේ "උපකුලපති තනතුර" ලෙස සටහන් කළ යුතුය.


**අධ්‍යක්ෂ ජනරාල්**
**පාලක මණ්ඩලයේ ලේකම්**
**වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය**
**නො. 100, කඳවල, රත්මලාන**

**Tel : 0112 630 708**
www.uovt.ac.lk
Email - **dg@uovt.ac.lk**


**2025 අගෝස්තු 31**